www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සියොන්වාදය කෙරෙහි විරෝධය ද යුදෙව් විරෝධය ද සමාන කිරීමේ බොළඳ වෑයමක්

**A crude attempt to equate anti-Zionism with anti-Semitism**

**ජාන් ෂෝල් විසිනි**
**2003 දෙසැම්බර් 22**

බ්‍රිතාන්‍යයේ *ගාඩියන්* පුවත් පතෙහි මෑතක දී පළ වූ ලිපියක ඊස්රායල සියොන්වාදී දේශපාලන සංස්ථාපිතය විසින් පලස්තීනුවන්ට එරෙහිව ගෙන යන සිය සාපරාධී ප්‍රතිපත්තිය පිලිබඳ සියලු විවේචන කුනු බක්කියට දැමීම සඳහා මෙහෙයවන ලද ඒකාබද්ධ පරිශ්‍රමයක හානිකර නිදසුනක් ගැබ්කර ගනියි.

සියොන්වාදය හා ඊස්රායල රාජ්‍යයෙහි විජිතවාදී ප්‍රතිපත්ති කෙරෙහි පලවන විරෝධය සමග යුදෙව් ජනතාව කෙරේ පොදු වෛරයකින් කටයුතු කල නාසිවරුන්ගේ අපකීර්තිමත් ප්‍රතිගාමී යුදෙව් විරෝධය සමාන කිරීමට ''සියොන් විරෝධය යුදෙව් විරෝධය යි: ඊස්රායලයට එරෙහි බොහෝ විවේචන පිටුපස ඇත්තේ යුදෙව්වන් කෙරේ එලිපිට ම ඇති වෛරය යි'' යන ශීර්ෂපාඨයට පසුව පල කරන ලද වැකියක් එමානුවෙන් ඔටොලෙන්ගි විසින් යොදා ගනියි.

ඔටොලෙන්ගි පෞද්ගලික පරිත්‍යාගයන් මත පවත්වාගෙන යන ඔක්ස්ෆර්ඩ්හි ශාන්ත අන්තෝනි විදුහලේ හීබ්‍රෲ හා යුදෙව් අධ්‍යයන පිලිබඳ ඔක්ස්ෆර්ඩ් කේන්ද්‍රයෙහි හා මැදපෙරදිග කේන්ද්‍රයෙහි ගරු තනතුරක් උසුලයි. එනමුදු කුමන තක්සේරුවක් යටතේ හෝ ඔහුගේ ලිපිය ශාස්ත්‍රීය නිර්මානයක් ලෙස සැලකිය නො හැක. ඔහුගේ උත්සාහය වූ කලී ඊස්රායලයෙහි ජාත්‍යන්තර ආධාරකරුවන් වෙනුවෙන් ඒරියල් ෂැරොන් තන්ත්‍රයට එරෙහි විරෝධතාව නිහඬ කිරීම හා නාසින්ගේ යුදෙව් සංහාරයට කිසිදු වගකීමක් නො දරන ජනතාවක් කෙරේ මහා ඊස්රායල ප්‍රතිපත්තිය හා කෲරත්වය නීතියුක්ත කිරීම අරමුනු කොටගත් එකකි. ඔටොලෙන්ගි නාසි යුදෙව් සංහාරය සියොන්වාදීන්ගේ විරුද්ධවාදීන්ට එරෙහි මුගුරක් ලෙසින් යොදාගැනීමට බලයි.

ඔහුගේ ලිපිය පලස්තීනුවන්ට එරෙහි සාපරාධී ක්‍රියාවල වගකීමෙන් ඊස්රායලය පූර්න වසයෙන් ම මුදාහරින අතර ෂැරොන්ට සිය අභිමතය පරිදි කටයුතු කිරීමට ඉඩ සලස යි. සිය හවුල් දේශපාලනයේ දී ඔටොලෙන්ගි අනෙකුන්ගේ දේශපාලන මතිමතාන්තර නො තකා ඊස්රායල රාජ්‍ය විවේචනයට ලක් කරන ඕනෑම කෙනෙකු යුදෙව් විරෝධයට ගැටගසයි. ඔටොලෙන්ගිගේ අදහසට අනුව පලස්තීනුවන් සම්බන්ධ ඊස්රායලයෙහි ප්‍රතිපත්තීන්හි නාසීන් යුදෙව්වන්ට එරෙහිව කරන ලද ක්‍රියාවන් සිහිගන්වන සුලු බව සටහන් කිරීමට අවකාශයක් නොමැත. යුදෙව් සංහාරයේ ගොදුරු බවට පත්වූවන් හා ඝාතකයන් අතර එවන් සමීකරනයක් යුදෙව් සංහාරය ප්‍රතික්ෂේප කිරීමකැ යි ඔහු කියා සිටියි. ''ඊටත් වඩා බැරෑරුම් වන්නේ නාසින්ගේ යුදෙව් සංහාරයේ අතීතය සඳහා නීතියුක්ත භාවයක් එමගින් සැපයීම යි. යුදෙව්වන් එතරම් ම පාපතරයන් සේ සලකන්නේ නම් ඔවුන් එම ඉරනමට ගොදුරුවන්නට සුදුස්සන් වන්නට ඇතැයි'' ඔහු තවදුරටත් කියා සිටියි.

මේ තර්කය ගොඩනැගී ඇත්තේ පුලුල් පරාසයක ය. ඊස්රායලය විසින් පලස්තීන ජනතාව අනාථයන් බවට පත් කිරීම, යටත් කිරීම, හා ප්‍රදේශය තුල කොටු කිරීම, පෝලන්ත ජාතිකයන්, ජිප්සිවරුන් හා අනෙකුත් සුලු ජාතිකයන් මෙන් ම දේශපාලන විරුද්ධවාදීන් ද අරබයා නාසීන් විසින් දියත් කරන ලද ප්‍රතිපත්තීන්ට කැපීපෙනන සමානකමක් පෙන්නුම් කරන බව කියන අයෙකු යුරෝපීය යුදෙව්වන් නාසි ගෑස් කාමර තුල දී මරාදැමූ බව ප්‍රතික්ෂේප කිරීම අවශ්‍ය නො වේ. මෙය පිලිගැනීම වූ කලි පලස්තීනුවන්ට එරෙහි ව සියොන්වාදීන්ගේ සාපරාධී ක්‍රියා යුදෙව් සංහාරයට සමාන කිරීමක් නො වේ. එය සිදුවූයේ වඩා පුලුල් පරිමාවක මිලෙච්ඡත්වයක් ලෙස ය. එහෙත් එය ඉතිහාසයේ සැබෑ විරෝධාභාසයක් ලෙසින් සලකුනු වෙයි.

එනම් මෙතරම් කලක් සමාජ ප්‍රගමනය වෙනුවෙන් ද සියලු ආකාරයේ පෑගීමට, වර්ගවාදයට හා පීඩනයට එරෙහි අරගලයට ද සම්බන්ධ වූ යුදෙව් ජනතාවට වෙනත් පීඩිත ජනතාවකගේ මානව හිමිකම් සාහසික ලෙස උල්ලංඝනය කිරීම යි. නිසැක ලෙස ම එවන් ප්‍රකාශයන් බොහෝ විට සැකසෙන්නේ යුදෙව්වන්ගේ ඉතිහාසය පිලිබඳ සංවේදනයන්ට හා සමාජ විඥානයට කෙරෙන ආයාචනයක් ලෙස ය. මෙය දේශපාලන අපරාධකරුවන් වන ෂැරොන් හා ඔහුගේ අනුගාමිකයන්ට අවබෝධ කර ගත හැක්කක් නො වේ.

තම විරුද්ධවාදීන් යුදෙව් විරෝධීන් ය යන මුසාව ෂැරොන් ආන්ඩුව හා සියොන්වාදී සංස්ථාපිතය සුපුරුදු ලෙස ම උපයෝගී කර ගනී. වර්ගවාදයෙන් මුසපත්වූවෙකු සේ පරිකල්පනය කල චූදිතයෙකුගේ ප්‍රතිවාදයක් නිර්මානය කරමින් ඔටොලෙන්ගි මෙය තවදුරටත් පෙරට ගෙන යයි. ''ඊස්රායලයේ යුදෙව් ආරක්ෂකයන් ඔවුන්ගේ විවේචකයන් විසින් නිරූපනය කරනුයේ මෙසේ ය. ඔවුන් ඊස්රායල් රාජ්‍යයට

නීතියුක්ත බවක් අත්කර දීමේ හේතු සොයන්නේ යුදෙව් බලපෑම් ප්‍රක්ෂේපනය කරමින් ද ආකෘතික යුදෙව් ගති ලක්ෂන විදහාපාන සදාචාරාත්මක ව සාධාරනීකරනය නො කලහැකි දෑ ආරක්ෂා කර ගැනීමේ දී පවා ''එක ස්ථාවරයක් ගැනීමේ'' කරුනු පදනම් කර ගනිමිනි.

සියොන් විරෝධීන් විසින් එක දිගට යොදා ගන්නා යුදෙව් විරෝධය ලෙස ඔහු විසින් හඳුන්වන තේමාවන් ඔහු පසුව ලැයිස්තුගත කරයි. ''ලොව පාලනය කිරීමේ කුමන්ත්‍රනය, යුදෙව්වන් මුදල් හා මාධ්‍ය සමග සම්බන්ධ කිරීම, වකුටු නහයකින් යුත් මසුරු යුදෙව්වා, ලේ නෑකම් පිලිබඳ අපහාසාත්මක ප්‍රකාශ, යුදෙව් සංකේත අවඥා සහගත ලෙස යොදාගැනීම හෝ සම්ප්‍රදායික ක්‍රිස්තියානි යුදෙව් විරෝධී රූප සංඥා, යනාදිය ඊස්රායල ක්‍රියාවන් විස්තර කිරීමට උපයෝගී කර ගැනේ.''

මෙසේ කියන්නේ කවරෙක් ද? ඉතාලියානු විකට චිත්‍රයක් ගැන සඳහනක් හා බ්‍රිතාන්‍ය විදේශ ප්‍රතිපත්තීන් මත බලපෑමක් ඇති ''යුදෙව් කල්ලියක්'' පිලිබඳ කම්කරු පාර්ලිමේන්තු මන්ත්‍රී ටැම් ඩැල්යෙල්ගේ සඳහනක් හැරුනු විට ඔටොලෙන්ගි නිශ්චිත නිදසුනක් ඉදිරිපත් නො කරයි. තමා උපුටා දක්වන ඉතාලියානු කාටූන් චිත්‍රයට මෙම ලේඛකයාට වගකිව නො හැකි නමුදු ඩැල්යෙල් වෙත එල්ල කරන ලද ප්‍රහාරය ගැන *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ලියා ඇත. (''බ්‍රිතාන්‍ය: කම්කරු පක්ෂය, යුද විරෝධී දඩයම ටැම් ඩැනියෙල් දක්වා ව්‍යාප්ත කරයි.'') එහෙත් සාරභූත පනිවිඩය වූ කලි සියලු සියොන් විරෝධීන් අමු අමුවේ ම යුදෙව් විරෝධී ප්‍රහාරවල'' යලි යලිත් නිරත වන බව යි. මේ සඳහා කිසිදු සාක්ෂියක් ඔහුට ඉදිරිපත් කල නො හැකි ය.

ඔටොලෙන්ගිගේ ප්‍රකාශයන් ප්‍රමුඛ වසයෙන් ම වංචනික ය. පලස්තීනුවන්ට ෂැරොන්ගේ තිරශ්චීන සැලකීම පිලිබඳව විවේචනශීලි වන්නන් බොහොමයක් ම ඊස්රායල හා යුදෙව්වන් වීමේ කාරනයෙන් ම මේ ප්‍රකාශන විසංවාදී වෙයි. ෂැරොන්ගේ ක්‍රියාවන්ගෙන් නො සතුටට පත් ඊස්රායල යුදෙව්වරුන් ලක්ෂයකට අධික සංඛ්‍යාවක්, දක්ෂිනාංශික අන්තවාදියකු අතින් ඝාතනයට ලක් වූ ඊස්රායල අගමැති යිට්ෂාක් රාබින්ගේ අටවැනි සංවත්සරය සැමරීම සඳහා නොවැම්බර් මස පවත්වන ලද පෙලපාලියකට සහභාගි වූ අතර ඔවුන් පලස්තීන ප්‍රදේශ අල්ලා ගැනීමට විරුද්ධ ව හා සාමය සඳහා ඉල්ලීම් සහිත පුවරු ප්‍රදර්ශනය කලහ. මෙය එක් නිදසුනක් පමනකි.

සියොන්වාදයේ යුදෙව් විවේචකයන්ට ඔහු වාර්ගික ස්වරූපයකින් ප්‍රතිචාර දක්වයි. ඔවුන් සැබවින් ම පාවාදෙන්නන් වන නිසා සියොන් විරෝධී හා යුදෙව් විරෝධී උද්ඝෝෂකයන්ගේ ප්‍රසංශාවට ඔවුන් ලක්ව ඇති බැවින් නිසැක වසයෙන් ම ඔවුන් ද්‍රෝහීන් පිරිසකැයි ඔහු කියා සිටියි. ''ඊස්රායලය හෙලා දැකීම මෙම එකමුතුව සඳහා වරපත්‍රයක් වෙයි.'' ''නෝම් චොම්ස්කි හා ඔහුගේ අනුගාමිකයෝ අලුත් වීරවරයන් වෙති. ඊස්රායලයෙහි පැවැත්ම පිලිබඳ තම අසතුට තුලින් පමනක් ම ඔවුන්ගේ යුදෙව් අභිමානය හා අනන්‍යතාවය ප්‍රකාශ වේ.''

## නාසීන්ගේ යුදෙව් සංහාරය හා සියොන්වාදී රාජ්‍යය

ඔටොලෙන්ගිගේ තර්කයෙහි කේන්ද්‍රීය කරුන මෙය යි. යුදෙව්වෙකු වීමේ හේතුවෙන් ම ඔහු සියොන්වාදියෙකු ද වේ. සියොන් විරෝධය යුදෙව් විරෝධය ම වේ ය යන ඔහුගේ ප්‍රකාශය ඊස්රායල් රාජ්‍යයේ ක්‍රියාපිලිවෙතත් සමස්තයක් ලෙස යුදෙව් ජනතාවගේ අවශ්‍යතාවන් මේ අනන්‍යකරනය මත රැඳේ. එවැනි සමීකරනයක් ඓතිහාසික වසයෙන් ද කරුනු වසයෙන් ද සාවද්‍ය වේ.

නාසින්ගේ යුදෙව් සංහාරය මුල්බැසගත් කරුනු ඓතිහාසික අත්දැකීමක් වූයේ යුදෙව්වරුන්ට පමනක් නො වේ. එය ලොව වටා කම්කරු ජනයාට ද එසේ ම වේ. එය දෙවැනි ලෝක සංග්‍රාමය තුල ඇති වූ ෆැසිස්ට්වාදී ලේඛනයෙහි වඩාත් ම විරූපී තනි නිදසුන විය. ප්‍රථම ලෝක සංග්‍රාමයෙන් පසුව ජර්මනිය මුහුන පෑ ආර්ථික බිඳවැටීමේ පසුබිම තුල යුදෙව්වන් දඩමීමා කර ගැනීම මගින් සුලු ධනේශ්වර හා ලුම්පන් කම්කරු ස්ථරයන් අතර තම පක්ෂය වෙනුවෙන් පොදු සමාජ අඩිතාලමක් ගොඩනැගීමට හිට්ලර් යුහුසුලු විය. යුදෙව් ''පොලීකරුවන්'' හා ව්‍යාපාරිකයන් මත ජනතාවාදී ප්‍රහාර එල්ල කිරීමේ දී හිට්ලර් නිසැකව ම මේ තත්වය උපයෝගී කරගත්තේ ය. එනමුදු යුදෙව්වන් කෙරේ ඔහුගේ වෛරය බැඳී තිබුනේ මාක්ස්වාදය පිලිබඳව ද ජර්මනියෙහි යුදෙව් කම්කරුවන් හා බුද්ධිමතුන් හොඳින් ම කැපීපෙනෙන ක්‍රියාකලාපයක් ඉටු කල බලගතු සමාජවාදී කම්කරු ව්‍යාපාරය පිලිබඳ ව ද ඔහු තුල තිබූ භීතිය සමග ය.

මේ අනුව ෆැසිස්ට්වාදයෙහි පරාජය හා යුදෙව් විරෝධයට එරෙහි අරගලය බැඳී තිබුනේ ෆැසිස්ට්වාදයට එරෙහිව පමනක් නො ව සමස්ත ධනේශ්වර පර්යායට ම එරෙහිව කම්කරු පන්තිය විසින් එල්ල කරන ලද ඒකාබද්ධ දේශපාලන ප්‍රහාරයත් සමග ය. එනමුදු නාසිවාදීන්ට එරෙහි වූ දශලක්ෂ සංඛ්‍යාත කම්කරුවන් නොමග යවා හිට්ලර්ට බලයට ඒමට ඉඩ ලබාදුන් ස්ටැලින්වාදයෙහි හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදයෙහි ඒකාබද්ධ පාවාදීම් මගින් මේ සිදුවීම වලක්වන ලදි.

සියොන්වාදීන් සතුව මෙයට හාත්පසින් ම වෙනස් වූ ඉදිරිදර්ශනයක් තිබුනි. යුදෙව් සංහාරයට පිලිතුරු සැපයිය හැකි එකම ක්‍රමය බයිබලයේ සඳහන් නිජභූමිය වෙතට ඔවුන් ගෙනඑමින් ඔවුන්ගේ ම රාජ්‍ය ස්ථාපිත කිරීම යයි ඔවුහු තරයේ කියා සිටියහ. සියොන්වාදීන්ට අනුව යුදෙව් නිර්ධන පන්තිය හා බුද්ධිමතුන් වෙත ඉදිරිපත් කල හැකි එක ම විසඳුම වූයේ ධනවාදය අවසන් කිරීමේ අරගලයෙහි තම පන්ති සොයුරුසොයුරියන් සමග එකතුවීම නො ව නව ධනේශ්වර රාජ්‍යයක් පිහිටුවීම පමනි.

1948 දී ඊස්රායල රාජ්‍ය පිහිටුවීම රැඳී තිබුනේ එක්සත් ජාතීන්ගේ සංගමයෙහි ප්‍රධාන බලවතුන්ගේ තීරන හා සටකපටකම් මත ය. යුදෙව්වන් මත කඩා පාත් වූ විනාශය පිලිබඳ ව කම්පාවට පත්ව සිටි ලොව වටා දශලක්ෂ සංඛ්‍යාත ජනතාව තුල ජනිත කරවන හා පන්ති විඥාත යුදෙව්වන් ඉදිරියේ මේ ක්‍රියාවලිය යුක්තිසහගත කිරීමේ මගක් ලෙස කම්කරු ව්‍යාපාරය,

සමානතාව, හා සමාජවාදය, සමග සියොන්වාදය ප්‍රතිබද්ධ කරවීමට වෙරදැරූ පුරසාරම් ද, එයට ඈඳනු ලැබුනි. එබැවින් රුදවුම් කඳවුරුවල බිහිසුනුකම් ඊස්රායල රාජ්‍යය බිහිවීමේ දී තීරනාත්මක භූමිකාවක් ඉටු කලේ ය.

## ඊස්රායලයෙහි ඓතිහාසික හා දේශපාලන වාර්තාව

එනමුදු 55 වසරකට පසුව අද දින සාකච්ඡාවට භාජන වන්නේ සියොන්වාදයෙහි ඓතිහාසික හා දේශපාලන වාර්තාව යි. මෙම පරීක්ෂනය තහනමට බඳුන් වූ එකකැයි පෙන්නුම් කිරීමට ඔටොලෙන්ගි උත්සාහ කරයි. ඔහුට අනුව ඊස්රායල රජය කල දෑ පිලිබඳ වෛෂයික අගැයීමක් සමන්විත වන්නේ අසීමිත යුදෙව් විරෝධයකිනි. මෙය ඉතා නිශ්චිත අරමුනක් වෙනුවෙන් යොදාගැනේ.

යුදෙව් සංහාරය හා යුදෙව් විරෝධය පෙරට ගෙන එන සියොන්වාදයෙන් තොරව ඊස්රායලයේ ඉතිහාසය පරීක්ෂා කල නො හැක. එය ඔවුන්ගේ විරුද්ධවාදීන්ට දොස්නැඟීමේ අරමුනු සහිත දෙයක් පමනක් නො වේ. එය කිසිවක් දේශපාලනිකව අවබෝධ කර ගත නො හැකි කරයි.

අන් රටවල් සම්බන්ධයෙන් වෙනත් කිසිදු විටෙක දී යොදා නො ගන්නා වූ ''අත්පත් කර ගත නො හැකි ඉහල මට්ටමකින්'' යුත් නිර්නායකයන් මත ඊස්රායලය විනිශ්චය කිරීම නිසා එම විවේචන යුදෙව් විරෝධී වේ යයි ඔටොලෙන්ගි ප්‍රකාශ කරයි. මෙය අපගේ අවධානය වෙනතකට හරවන්නකි. මෙය අපසරනයකි. මහජනතාවට රටක් වෙන් කොට සැලකීමේ සියලු අයිතියක් ම තිබේ. මන්ද යත් ඊස්රායලය පලස්තීනු භූමිභාගයන් නීති විරෝධීව අල්ලාගෙන සිටීමටත් එහි වැසියන් තිරශ්චීන ලෙස මර්දනය කිරීමටත් විශේෂිත හැකියාවක් ලැබී ඇත්තේ ලෝකයේ ප්‍රමුඛ අධිරාජ්‍යවාදී බලයක් විසින් සිදු කරනු ලබන්නා වූ බොහෝ අපරාධයන්ගෙන් එකක් වන එක්සත් ජනපදයේ මූල්‍ය, මිලිටරි හා දේශපාලන සහයෝගය මත පමනක් ම වීම නිසා මෙසේ වෙන්කොට සැලකීම විශේෂයෙන් ම අදාල ය.

ඔහුට අනුව ''සාමාන්‍ය සිදුවීමක් වන අන් සියලු ජාතීන් වරදෙහි බැඳීම ඊස්රායලයට ද පොදු ය.'' ''ඊස්රායලය විනිශ්චය කිරීම සඳහා පරමාදර්ශී රාජ්‍යයන්ට අදාලවන ප්‍රමිතීන් නො ව සියලු රටවලට පොදු ප්‍රමිතීන් යොදා ගැනීම යෝග්‍ය'' යයි ඔහු කියා සිටියි. අවසානයෙහි ඔහු සඳහන් කරන මේ කාරනය සම්බන්ධයෙන් *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* එකඟ වෙයි. ඒ වාර්තාව පිරික්සා බලමු.

ඊස්රායලය පිහිටුවන ලද්දේ එම ප්‍රදේශයෙහි ස්වදේශික පලස්තීනුවන් බලහත්කාරයෙන් නෙරපා හැරීම තුලින් ය. මෙය හුදෙක් මිනිසුන්ට තම නිවෙස්වලින් පලායාමට මගපෑදූ යුද්ධයක ප්‍රතිඵලයක් නො ව වත්මන් ලිකුඩ් ආන්ඩුවෙහි පූර්වගාමීන් වන සියොන්වාදී ත්‍රස්ත කන්ඩායම්වල ප්‍රතිපත්තිය විය. ඉතිහාසඥයින් විසින් පිලිගෙන ඇති පරිදි මේ සඳහා ඊස්රායලයේ නිර්මාතෘවරුන්ගේ හා එහි ප්‍රථම අගමැති ඩේවිඩ් බෙන්ගුරියන්ගේ අනුමැතිය ලැබී තිබුනි. එවක් පටන් ඊස්රායලය නිමක් නැති යුද්ධ ගනනාවක යෙදී ඇත. ඒ අතර අනෙක් රටවලට එරෙහි ප්‍රකුපිත නො කල ආක්‍රමනකාරී යුද්ධ ද, 1956 ඊජිප්තුවට 1978 හා 82 දී ලෙබනනයට එරෙහි යුද්ධ ද වන අතර ඒවා එක්සත් ජාතීන්ගේ විවිධ යෝජනා විවෘතව ම උල්ලංඝනය කරනු ලැබී ය. 1967 පටන් ඊස්රායලය මේ ප්‍රදේශ නීති විරෝධීව ඈඳාගෙන සිටියි. නැගෙනහිර ජෙරුසලම හා 200කට අධික ජනාවාස සංඛ්‍යාවක ඉඩම් හා ගම්බිම් ඊස්රායලය තමන් සතුකරගෙන සිටියි. ඊස්රායල හමුදා සේනාංක පලස්තීන නගර තුලට නැවත නැවතත් කඩාවැදී ඇති අතර 2000 සැප්තැම්බරයෙහි ඉන්ටිෆාඩා විරෝධතා ව්‍යාපාරය ආරම්භවීමේ තැන් පටන් ඊස්රායල හමුදා හා සියොන්වාදී පදිංචිකරුවන් විසින් පලස්තීන පදිංචිකරුවන් 2500කට අධික සංඛ්‍යාවක් ඝාතනය කර ඇත. මින් වැඩි කොටසක් නිරායුධ සිවිල් වැසියන් ය. එමෙන් ම ලමුන් ය.

ලෝකයේ ඇති ආන්ඩු අතරින් වඩාත් ම ප්‍රචන්ඩ එකක් වන ඊස්රායලය මිනිසුන් පදිංචි නිවාස කඩා බිඳ දැමූහ. ඔලිව් වතු හා ගොවිපලවල් විනාශ කලහ. මාර්ග වසා ඇඳිරිනීතිය පනවනු ලබ යි. පලස්තීන ආර්ථිකය අඩපන කර ජනතාව සාගතයකට ඇදදමා තිබේ. එය නඩු විභාග නොමැතිව දිගුකලක් නීතිවිරෝධීව මිනිසුන් සිරභාරයේ තබයි. රුඳවියන්ට වධහිංසා පැමිනවීම හා අමානුෂික ලෙස සැලකීම සාමාන්‍ය තත්වයකි. ඊස්රායලය මිනිසුන් රටෙන් පිටුවහල් කරති. සිය විරුද්ධවාදීන් දේශපාලනිකව ඝාතනය කිරීමේ ප්‍රකාශිත පිලිවෙතක් එය සතු ය.

බටහිර ඉවුරෙහි සිට ගාසා තීරය දක්වා ද ඒ අතර ද පමනක් නො ව ප්‍රදේශ තුල ම මාර්ග වසා තැබීම ද ඒ සමග ම බටහිර ඉවුර ඊස්රායලයෙන් වෙන් කෙරෙන අපකීර්තිමත් ආරක්ෂක පවුර හේතුකොට ගෙන පලස්තීනුවන් කොටු කල බිම් ප්‍රදේශ තුල සිරකරුවන් වන තත්වයක් නිර්මානය කර තිබේ. විදුලිය කැවූ කටුකම්බි වැටවලින් ඊස්රායලයෙන් වෙන් කර තම දිවි ගෙවීමේ සෑම මාවතක් ම අහිමි කරන ලද ගාසා තීරුවෙහි වෙසෙන බහුතර ජනතාව මුහුන දෙන තත්වයන් යෝධ රුඳවුම් කඳවුරක තත්වයට සමාන වේ.

ඊස්රායලය වනාහි න්‍යෂ්ටික අවි ප්‍රසාරනය නො කිරීමේ සම්මුතියට අත්සන් තැබීම හෝ සිය න්‍යෂ්ටික වැඩකටයුතු පිලිබඳ ජාත්‍යන්තර නිරීක්ෂනයකට ඉඩ නො දෙන න්‍යෂ්ටික අවි සතු රාජ්‍යයකි. තව ද ඊස්රායලය සතුව එවැනි අවි 200ක් ඇති බවත් පුලුල් ජීවවිද්‍යාත්මක හා රසායනික අවි වැඩපිලිවෙලක් එය සතුව ඇති බවත් කවුරුත් දන්නා දෙයකි. ඊස්රායලයේ න්‍යෂ්ටික අවි පිලිබඳ තොරතුරු මෙතෙක් ප්‍රසිද්ධියට පත්ව නැත්නම් එයට හේතුව මැදපෙරදිග එක්සත් ජනපද අවශ්‍යතාවන්ගේ ආරක්ෂකයා වසයෙන් ඊස්රායලය ඉටු කරන ක්‍රියාකලාපය යි.

1981 වසරේ ඉරාක න්‍යෂ්ටික අවි විනාශ කිරීමට පියවර ගන්නාක් මෙන් සිය ජාත්‍යන්තර වගකීම්වලට පටහැනිව යමින් න්‍යෂ්ටික අවි තැනීම අරඹා ඇති බවට ඊස්රායලයේ චෝදනාවට ලක්ව සිටින ඉරානයට එරෙහිව පූර්වභංග ක්‍රියාමාර්ගයක් ගන්නා බවත් එය පවසා තිබේ.

මිලිටරි ආධාර සැපයීමේ මුවාවෙන් එක්සත් ජනපදය දශක ගනනාවක් තුල වසරකට ඩොලර් බිලියන ගනනින් ඊස්රායලයට මූල්‍යාධාර සපය යි. මෙයින් වැඩි කොටස එක්සත් ජනපදය තුල ම වියදම් කලයුතු වේ.

1982 වසරෙහි සබ්‍රා හා ෂටිලා කඳවුරුවල පලස්තීන සරනාගතයන් මිනීමරු ෆැලැන්ගිවාදී මැරයන්ගෙන් ආරක්ෂා කර ගැනීමට අසමත් වීම වෙනුවෙන් පෞද්ගලිකව ම වගකිව යුතු යයි එරට අධිකරන කොමිසම විසින්ම තීරනය කල හා එබැවින් රජයේ ඇමති තනතුරක් දැරීමට නුසුදුසු යයි තීන්දු කල පුද්ගලයා ඊස්රායලයේ රාජ්‍ය නායක තත්වය දරයි. එය ලෝකයේ ඇති එවන් එකම රට යි.

ජන සංක්‍රමනය යන ප්‍රෝඩාව යටතේ ජනවාර්ගික පවිත්‍රකරනය විවෘතව ඉල්ලා සිටින අන්තගාමී ජාතිකවාදී පක්ෂ මත රැඳී පවතින ආන්ඩුවක ය ෂැරොන් නායකත්වය දරන්නේ. දකුනු අප්‍රිකාවෙහි අපකීර්තිමත් වර්ගභේදවාදී ඇපාතයිඩ් තන්ත්‍රය සිහිගන්වන ප්‍රතිපත්තියක් පලස්තීන ඊස්රායල්වරුන් සම්බන්ධයෙන් ඊස්රායල් ආන්ඩුව ද අනුගමනය කරයි. ඔවුන්ගේ දේශපාලන අයිතීන් සීමා කරයි. ආර්ථරික සම්පත්වලින් හා සමාජ සුබසාධනයෙන් ඔවුන්ට හිමිවිය යුතු සාධාරන පංගුව අහිමි කරයි. බටහිර ඉවුරෙහි හා ගාසා තීරයෙහි පලස්තීනුවන් විවාහ කරගන්නා ඊස්රායල් පුරවැසියන්ට සිය සහකරුවන් සමග සිය රට තුල ජීවත්වීමේ අයිතිය අහිමි කිරීම සඳහා ආන්ඩුව මෑතක දී නීති පැනවී ය.

ලොව පුරා විසිර සිටින යුදෙව් ජනයා පිලිබඳව කෙසේ වුව ද ඊස්රායලයෙහි යුදෙව් ජනයාගෙන් බහුතරයෙහි අවශ්‍යතාවන් පවා ෂැරොන් ආන්ඩුව නියෝජනය නො කරයි. ආන්ඩුව මූල්‍ය ප්‍රභූවෙහි කොටස්වල දේශපාලන නියෝජිතයා ද එක්සත් ජනපද බුෂ් පරිපාලනයෙහි තැරැව්කරුවා ද වෙයි.

ඊස්රායලයෙහි ශ්‍රම බලකායෙන් සියයට 10කට වැඩි ප්‍රමානයක් විරැකියාවෙන් පෙලෙති. තවත් බොහෝ කොටසක් දුප්පතුන් වෙති. ලෝක අවපාතයෙහි හා පලස්තීන ඉන්ටිෆාඩා නැගිටීමේ බලපෑම යටතේ ඊස්රායලයට මුහුනදීමට සිදුව ඇති බරපතල ආර්ථික පරිහානියේ බර කම්කරුවන්ගේ හා ඔවුන්ගේ පවුල්වල කරපිට පැටවීමේ උත්සාහයක යෙදෙන ෂැරොන් ආන්ඩුව, රැකියා, ජීවන තත්වයන් හා සමාජ ආරක්ෂක දැල මත රුදුරු ප්‍රහාරයක් එල්ල කරමින් සිටී. රාජ්‍ය අංශයෙහි කම්කරුවන්ගේ වැඩ වර්ජනය කිරීමේ අයිතිය සීමා කෙරෙන හා සමාජ සුබසාධනය ඉවත් කෙරෙන නීති සම්පාදනය කර ඉදිරිපත් කරන බවට මුදල් ඇමති බෙන්ජමින් නෙතන්යාහු මෑත දී නිවේදනය කලේ ය.

වාර්තාවෙන් පෙන්නුම් කෙරෙන්නේ ජාත්‍යන්තර නීති පිලිබඳ කිසිදු තැකීමකින් තොරව උල්ලංඝනය කිරීම හා කුරිරු හා මර්දනකාරී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඊස්රායලය ජාත්‍යන්තරව හෙලාදැකීමට ලක්විය යුතු බව ය.

## සියොන්වාදී රාජ්‍ය හා යුරෝපයෙහි යුදෙව් විරෝධයෙහි නැගීම

''මෑත දී නැගී ආ යුදෙව් විරෝධය පලස්තීන-ඊස්රායල ගැටුමට සම්බන්ධය'' යි ඔටොලෙන්ගි පිලිගන්නා විට ඔහු ඉදිරිපත් කරන්නේ නිවැරදි කරුනකි.

එසේ වුව ද, මේ පිලිගැනීමේ ස්ථාවරයෙන් ඔහු ඉක්මනින් ම පසුබසී. ඔහු එසේ පසුබසින්නේ සියොන්වාදී ව්‍යාපෘතියෙහි ස්වභාවය හා ශක්‍යතාවය ගැන මින් කියැවෙන දෑ සම්බන්ධයෙන් දේශපාලන නිගමනවලට එලඹෙන හෝ ඊස්රායලයට කොන්දේසි විරහිතව සහාය ලබා නො දෙන හෝ ඕනෑම කෙනෙකු යුදෙව් විරෝධියකු බවට අවධාරනය කරන විට ය: ''ඊස්රායලය සම්බන්ධයෙන් අගතිගාමී ආකල්පයක් ගෙන එන්නේ එරටෙහි චර්යාව හා එයට යුදෙව්වරුන්ගෙන් ලැබෙන සහාය හේතු කොටගෙන ය යන තර්කය, යහපත්ම ලෙස සැලකුව හොත් හිස් එකක් වන අතර නරකම අතට ගතහොත් දුෂ්ට එකක් වේ.

එම තර්කයෙහි අර්ථය වන්නේ යුදෙව්වන් වෙනුවෙන් අනුකම්පාව රැඳී පවතිනුයේ ඔවුන් ඉදිරිපත් කරන දේශපාලන දෘෂ්ටීන් මත ය යන්න ය. මෙය කිසිසේත් ම ඔවුන්ගේ ඉවසීම පිලිබඳ ප්‍රශ්නයක් නො වේ. එමගින් යුදෙව්වරු වෙන් කර සැලකේ. එය යුදෙව් විරෝධය වේ.''

අද දින යුදෙව් විරෝධය යලි අවුලුවන වඩාත් ම ප්‍රබල එක් සාධකයක් වන්නේ නිසැකව ම ෂැරොන් යටතේ ඊස්රායල ආන්ඩුව විසින් යොදාගන්නා කෲර විධික්‍රමයන් ය. මාධ්‍ය වෙත කරන ලද යුරෝපා සංගමයෙහි වාර්තාවක් මගින් පෙන්නුම් කෙරෙන්නේ යුරෝපීය මුස්ලිම් තරුනයන් විසින් යුදෙව්වරුන් මත එල්ල කරන ලද ප්‍රහාර සංඛ්‍යාවෙහි නැගීමකි. වර්ගවාදය හා විදේශිකයන් කෙරෙහි භීතිකාව අධීක්ෂනය කිරීමේ යුරෝපීය කේන්ද්‍රය විසින් සකස් කරන ලද මෙම වාර්තාව, යුදෙව්වරුන් මත එල්ල කෙරෙන ප්‍රහාරයන්ගේ නැගීම හා මැදපෙරදිග සිද්ධීන් අතර සම්බන්ධයක් දකියි. මෙය වෙසෙසින් ම දකිනුයේ 2000 සැප්තැම්බර් මස පලස්තීන ඉන්ටිෆාඩාවෙහි, පැනනැගීමෙන් හා පසුගිය වසරෙහි අප්‍රේල් මස බටහිර ඉවුරෙහි ජෙනින් නගරයට ඊස්රායලය විසින් එල්ල කරන ලද ප්‍රහාරවලින් පසුව ය.

මේ කාරනය පිලිගැනීම යුදෙව් විරෝධී දෘෂ්ටීන් පිලිගැනීමක් හෝ එම දෘෂ්ටීන් දරන අය ආරක්ෂා කිරීමක් හෝ නො වේ. එනමුදු, බොහෝ විට දේශපාලන අවබෝධයක් නොමැති දෙවැනි පරම්පරාවේ අරාබි හා අප්‍රිකානු සංක්‍රමනිකයින් අතර යුදෙව් විරෝධය බියකරු ලෙස ඉස්මතුවීම සඳහා දේශපාලන පදනමක් පැනනැගීම නො සලකා හැරිය නො හැක. එවැනි විපත්තිදායක වර්ධනයකට එරෙහිව සටන් වැදිය හැක්කේ සියොන්වාදී රාජ්‍යයට හා ජනතාවගේ දේශපාලන අසන්තෝෂය ගසාකෑම සඳහා යුදෙව් විරෝධය උපයෝගී කර ගන්නා ඉස්ලාමීය මූලධර්මවාදීන් හා ධනේශ්වර අරාබි නායකයින් යන දෙකොටසට ම එරෙහිව ප්‍රතිපත්තිගරුක ප්‍රතිවාදයක්

ඉදිරියට ගැනීමෙන් පමනි. ෂැරොන්ගේ අපරාධ ගැන නිහඬවීම හෝ ඔටොලෙන්ගි සම්පාදනය කරන්නාක් වැනි ක්ෂමාලාප ඉදිරිපත් කිරීම යුදෙව් විරෝධය තවදුරටත් උත්සන්න කරනවා පමනි. තව ද, එය ලෝක පරිමානව දක්ෂිනාංශ බලවේග ශක්තිමත් කරයි.

ෂැරොන් ආන්ඩුව ෆැසිස්ට්වාදී පක්ෂ දෙකක් මත රඳා පවතී. මින් එකක් ඈඳාගත් පෙදෙස්වල ජනපදිකයන් අතර වෙසෙන දක්ෂිනාංශික රස්තියාදුකාරයින් හා මැරයින් මත පදනම් වේ. අනෙක බටහිර ඉවුරෙන් හා ගාසා තීරුවෙන් පලස්තීනුවන් පිටුවහල් කරන ලෙසට විවෘතව ම පෙලඹවීම් කරන පක්ෂයකි. ෂැරොන් ආන්ඩුව මුලුමනින් ම රඳාපවතින්නේ බුෂ් පාලන තන්ත්‍රය මත හා ඩොලර් බිලියන ගනනින් ලැබෙන මිලිටරි ආධාර හා නය මත ය.

එක්සත් ජනපදයෙහි අන්ත දක්ෂිනාංශික ක්‍රිස්තියානි මූලධර්මවාදීන් හා දක්ෂිනාංශික සියොන්වාදීන් අතර සන්ධානයක් වර්ධනය වෙමින් පවතී. ඉරාකයට එරෙහි අරාබි විරෝධී ස්වොත්තමවාදය හා මිලිටරි ආක්‍රමනකාරීත්වය මත පදනම් වී, සියොන්වාදී දක්ෂිනාංශය එක්සත් ජනපදයෙහි මෙන් ම යුරෝපයෙහි ද යුදෙව් විරෝධය සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයක් ඇති කන්ඩායම් සමග එකට පෙලගැසී සිටිති. ෂැරොන්, යුරෝපයෙහි තමන්ගේ ඉතාමත් උද්යෝගිමත් ආධාරකරුවකු වන ඉතාලි අගමැති සිල්වියෝ බර්ලුස්කෝනිගේ ආගන්තුක සත්කාර ලද්දේ සති කිහිපයකට පෙර ය. ''මුසෝලිනි කිසිවෙකු මරාදැමුවේ නැත. අභ්‍යන්තර පිටුවහලත් ලෙස, මුසෝලිනි, මිනිසුන් නිවාඩු ගැනීමට පිටත් කලේ ය.'' යන ප්‍රකාශය මගින් ෆැසිස්ට්වාදී ආඥාදායකයෙකු වූ මුසෝලිනි ආරක්ෂා කිරීමට මෑත දී ඉදිරිපත්වීමෙන් පුවත්පත්වල සිරස්තල ලියැවුනේ ද ජනතාවගේ ඇඩි කෝපයට ලක්වූයේ ද මේ ඉතාලි අගමැතිවරයා ම ය. මුසෝලිනිගේ ෆැසිස්ට්වාදී පක්ෂයෙහි දේශපාලන උරුමකරු වන, ජාතික සන්ධානයෙහි නායක, ඉතාලියේ නියෝජ්‍ය අගමැති, ගියන් ෆ්‍රැන්කෝ ෆිනීට සාදයක් පවත්වමින් නොවැම්බර් 25 දා ෂැරොන් තවත් ඉදිරි පියවරක් තැබී ය.

ෆිනී 1990 ගනන්වල මැද භාගය තෙක් ම, මුසෝලිනි, ''20 වැනි සියවසෙහි විසූ ශ්‍රේෂ්ටතම රාජ්‍ය පාලකයා'' ලෙස හැඳින්වී ය. ''අප මහ ජනතාවගේ ඉතිහාසයෙහි ලජ්ජාසහගත පරිච්ඡේදයන්'' ලෙස දැන් ඔහු ඒ ඉතිහාසහ අපවාදයට ලක් කරයි. එනමුදු සැබවින් ම, ෆිනී කෙරෙහි ෂැරොන්ගේ ලෙන්ගතුකමට හේතුව පලස්තීනුවන්ට එරෙහිව ඊස්රායලය දියත් කරන මර්දනයටත් කොටු පවුර ඉදිකිරීමටත් ෆිනීගේ සහාය පලවීම, හේතු කොට ගෙන ය. ෂැරොන්ගේ පැත්තෙන් බලන විට නම් අද දින ඊස්රායලයට සහාය දැක්වීම හේතුකොට ගෙන යුදෙව් විරෝධයෙහි ලේෂ මාත්‍රයක් පවා කටුගා දමනු ඇත. යුරෝපීය යුදෙව්වන්ගේ සමූල ඝාතනය පැතර් ෆැසිස්ට්වාදීන්ගේ සහකරුවන්ට පවා මෙය බලපායි.

සියොන්වාදී රාජ්‍ය එවැනි සහකරුවන් සොයායැමත් එය යුදෙව් විරෝධය ජනිත කරවන තවත් ප්‍රධාන සාධකයක් වීමත් සැබැවින් ම ඉතිහාසයේ තවත් ඛේදනීය උත්ප්‍රාසයකි. එවැනි ප්‍රතිගාමී ප්‍රතිඵල පෙන්නුම් කරන්නේ දෙවැනි ලෝක සංග්‍රාමයෙන් හා නාසිවරුන්ගේ යුදෙව් සංහාරයෙන් පසුව ඇති වූ තත්වය තුල ඊස්රායලය නිර්මානය කිරීම තුලින් යුදෙව්වරුන්ට පිලිගැන්වී යයි පෙනී ගිය, මර්දනයෙන් හා වෙනස්කම් කිරීම්වලින් තොර සුරක්ෂිත කෙම්බිමෙන් බොහෝ සෙයින් දුරස්ථ බව යි. එනමුදු, මේ තත්වය, වෙනත් ජනතාවක් පිටුවාහල් කිරීම තුලින් නිර්මානය කලා වූ ද රටින් පිටත දී යුද්ධය හා මර්දනය මගින් ද රට තුල දී සමාජීය සූරාකෑම හා අසමානතාව මගින් ද නඩත්තු කරන ලද්දා වූ ධනේශ්වර රාජ්‍යයක් නිර්මානය කිරීමේ සියොන්වාදී ව්‍යාපෘතියෙහි ද අනිවාර්ය නිමැවුමක් වේ. එවැනි රාජ්‍යයකට, තම පුරවැසියන්ට පවා සමාජ සාධාරනය හා සමානතාව අත් කර දීමට අඩිතාලම් සැපයිය නො හැක.

සියොන්වාදී ව්‍යාපෘතියෙහි අසාර්ථකත්වය යුදෙව් ජනයාගේ පාර්ශ්වයෙන් ඇති වූ කිසියම් අඩුලුහුඩුකම්වල ප්‍රතිඵලයක් නො වේ. එය වැඩ කරන ජනතාව මුහුන දෙන මූලික සමාජ, ආර්ථික හා දේශපාලන ගැටලු විසඳීම සඳහා ජාතිකවාදී ඉදිරිදර්ශනයක පිහිටාගත්තා වූ මැද පෙරදිග අප්‍රිකාව හා ආසියාව තුල සියලු ව්‍යාපාරවල අසාර්ථකත්වයෙහි ප්‍රකාශනයක් වේ.

සියොන්වාදය, බිහිසුනු හා අසාර්ථක පර්යේෂනයක ප්‍රතිඵලයක් වී යැයි පිලිගැනීමට දැන් කාලය එලඹ තිබේ. එය තවදුර පැවැත්ම, පලස්තීනුවන් හා ඊස්රායල්වරුන් යන දෙකොටස වෙත ම තවදුරටත් එල්ලවනු ඇති මර්දනයේ හා කටුක යුද්ධයේ පෙරනිමිත්තක් වනු පමනි.

වර්තමානයේ ඇති වී තිබෙන මෙම හිරවීමෙන් මිදීමේ එකම මග, ධනවාදයට එරෙහි වූ ද සමාජවාදී සමාජයක් ගොඩනැගීම සඳහා වූ ද, පොදු අරගලයක් තුල අරාබි හා යුදෙව් කම්කරුවන් හා බුද්ධිමතුන් ඒකරාශි කිරීම අරමුනු කොට ගත් දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම ය. පලස්තීන කම්කරුවන් හා ගොවීන් අත්විඳි ඓතිහාසික අසාධාරනකම් නිවැරදි කිරීමේ ද ජාත්‍යන්තර ප්‍රාග්ධනයෙහි හා ඊස්රායල හා අරාබි පාලක කල්ලිවල ලාභ සූරාකෑමේ ආයාසයෙන් අවුලුවන ලද මර්දනය හා යුද්ධය නමැති ද්විත්ව පාපයන් අවසාන කිරීමේ ද එකම මග එය වේ. මැදපෙරදිග එක්සත් සමාජවාදී ජනපදය නිර්මානය කිරීම තුලින් සියල්ලන්ගේ ම සමාජ, ආර්ථික හා දේශපාලන අභිලාෂයන් සපුරාලීම සඳහා සම්පත් උපයෝගී කර ගත හැකි පරිදි කලාපයෙහි ජනතාවන් හා ආර්ථිකයන් දැනට බෙදා වෙන් කරන අධිරාජ්‍යවාදී කුමන්ත්‍රන මගින් අටවන ලද බාධක ඉවත් කෙරෙනු ඇත.

© www.wsws.org